# ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය
# හා එහි නූතන ප්‍රවණතා

එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

දර්ශනපති පරීක්ෂණය සඳහා සංස්කෘතික අධ්‍යයනය

විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධය යි.

2013/01/21

දර්ශනපති 2011

Library - USJP
207922
207922

# ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ විකාශය

# හා එහි නූතන ප්‍රවණතා

එම්. අයි. එස්. ද සිල්වා වීරක්කොඩි

## නිබන්ධ සාරාංශය

මෙම අධ්‍යයනය මගින් උත්සාහ කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන විකාශය හා එහි නූතන ප්‍රවණතා පිළිබඳ විමසා බැලීමට ය. ඒ අනුව ලංකාවේ සංගීත අධ්‍යාපනය කිනම් වකවානුවක ඇරඹිණි ද, එහි ගමන්මග කෙබඳු ද, එහි වර්තමාන ස්වභාවය හා එයට ඇති අභියෝග කවරේ ද, එම අභියෝග ජය ගැනීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග කවරේ ද යන්න විමසා බැලීමට මෙමගින් යත්න දරා ඇත.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සෞන්දර්ය විෂයක් ලෙස පෙරදිග සංගීතය ආරම්භ වී ඇත්තේ 1928 තරම් ඈත කාලයක දී වන අතර, වර්තමානයේ එම විෂය පශ්චාද්-උපාධි මට්ටම දක්වා වර්ධනය වී ඇත. එහෙත් මෙම සංගීත අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ව සිදු කරනු ලැබ ඇති ශාස්ත්‍රීය පර්යේෂණ ඉතාමත් විරල බව මෙහි දී අවබෝධ වූ කරුණකි. එම නිසා දේශීය මෙන් ම විදේශීය වශයෙන් විවිධ විද්වතුන් විසින් පළ කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ඔවුන ගේ අදහස් මෙන් ම සංගීත ක්ෂේත්‍රයට අදාළ චක්‍රලේඛ, වාර්ෂික වාර්තා, සංඛ්‍යා ලේඛන, අත්පොත්, අධ්‍යාපන මොඩියුල යනාදිය ඇසුරෙන් මෙම පර්යේෂණය සඳහා අවශ්‍ය තොරතුරු සම්පාදනය කරගන්නා ලදී. ඒ අනුව සමස්ත සංගීත ගුරු ප්‍රජාව ආවරණය වන පරිදි දිස්ත්‍රික් කිහිපයකින් තෝරාගත් අහඹු ගුරු නියැදියක් වෙත සංවෘත ප්‍රශ්නාවලියක් යොමු කිරීමෙන් ගුරු ආකල්පය විමර්ශනය කළෙමි. එමෙන් ම අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටි සමස්ත පෙරදිග සංගීත ශිෂ්‍ය ප්‍රජාව නියෝජනය වන පරිදි 10% ක ශිෂ්‍ය නියැදියක් විශ්ලේෂණය කිරීමෙන් නිගමන කරා එළඹීමට උත්සහ දරන ලදී.

සංගීත විෂයේ විකාශය පිළිබඳ විමසීමේ දී එය දශක අටකට වැඩි දීර්ඝ ඉතිහාසයක් දක්වා ගමන් කරන බවත්, විවිධ වකවානුවල දී නොයෙක් වෙනස්කම්වලට භාජනය වෙමින් වර්තමානය දක්වා ම අඛණ්ඩ ව පැවති විෂයක් බවත් අනාවරණය විය. පසුගිය දශකය දෙස විශේෂ අවධානය යොමු කිරීමේ දී පෙරදිග සංගීත විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව මූලික ව හඳුනාගත හැකි ප්‍රවණතා රාශියක් වේ.

කෙසේ වුව ද, දත්ත විශ්ලේෂණය කිරීමේ දී අනාවරණය වූ ප්‍රධානතම කරුණක් වන්නේ මෙකී විෂයට තිබූ සාපේක්ෂ වැදගත්කම ක්‍රමයෙන් හීන වී ඇති බව ය. නැතහොත් සංගීත විෂය මෙරට අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය තුළින් ගිලිහෙමින් පවතින බව කැපී-පෙනුණි. තව ද මෙකී විෂය ක්ෂේත්‍රය ආශ්‍රිත ව හඳුනාගත හැකි ගැටලු කිහිපයකි. එනම්, පාසල් විෂය මාලාව තුළ නිසි තැන හිමි නොවීම, ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා නොපැමිණි ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම, ගුරුවරුන් ගේ උදාසීන බව, පරිපාලන දායකත්වය අවම වීම, මූලික පහසුකම් තවමත් ප්‍රමාණවත් නොවීම යනාදිය ඒ අතර වේ.

පෙරදිග සංගීත විෂය තව දුරටත් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ රඳවා තබාගත යුතු විෂයක් වන බැවින් එය සුරක්ෂිත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමේ අවශ්‍යතා ව ඉස්මතු ව ඇති බව පෙනේ. ඒ අනුව විෂයේ ප්‍රගමනය උදෙසා අනුගමනය කළ හැකි වෙති යි අපේක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයකි. ඒ අතර සංගීත ගුරුවරයා ගේ නිසි ගෞරවය හා වෘත්තීයමය තත්ත්වය නගා සිටුවීම, ගුරු පුහුණුව යාවත්කාලීන කිරීම, සංගීත අධ්‍යාපන කළමනාකරණය විධිමත් කිරීම, සංගීත අධ්‍යාපනයට අදාළ මූලික පහසුකම් ප්‍රවර්ධනය කිරීම, නිපුණතා පාදක අධ්‍යාපනය තුළ ශිෂ්‍ය කාර්යය ප්‍රබල කිරීම යනාදිය වේ. මෙකී යෝජනා ක්‍රියාවට නැංවීමට හැකියාවක් තිබේ නම් දශක අටකට වැඩි ඉතිහාසයක් ඇති පෙරදිග සංගීත විෂය වර්තමානයේ පවතින තත්ත්වයට වඩා යම් ප්‍රමාණයකින් හෝ නගා-සිටුවීමට හැකි වෙති යි අපගේ විශ්වාසය යි. ඒ සඳහා වගකිවයුත්තන් ගේ මෙන් ම ගුරු සිසු පරපුරේ ද අවධානය යොමු විය යුතු කාලය එළඹ ඇති බව අවධාරණය කළ යුතු වේ.

# අනුක්‍රමිකාව


- අපේක්ෂකයා ගේ ප්‍රකාශය
- උපදේශක සහතිකය
- අනුක්‍රමිකාව
- උපකාරානුස්මෘති
- නිබන්ධ සාරාංශය
- වගු නාමාවලිය
- ප්‍රස්තාර නාමාවලිය

1 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

1.2 පර්යේෂණ ගැටලුව

1.3 පර්යේෂණ අරමුණු

1.4 උපකල්පනය

1.5 පර්යේෂණ ක්‍රමවේදය

1.6 පර්යේෂණ ක්ෂේත්‍රය/ සීමා

1.7 පර්යේෂණ වැදගත්කම

**2 පරිච්ඡේදය**

**2.1 සෞන්දර්ය අධ්‍යාපනය තුළ සංගීත අධ්‍යාපනය**

2.1.1 සංගීතය, සංගීත අධ්‍යාපනය හඳුනාගැනීම

2.1.2 සංගීතවේදය හෙවත් සංගීතවිද්‍යාව

2.1.3 සංගීත අධ්‍යාපන වැදගත්කම හා ප්‍රතිලාභ

**2.2 සංගීත අධ්‍යාපන අරමුණු (විෂය පථය)**

2.2.1 ප්‍රජානන ක්ෂේත්‍රයේ අරමුණු

2.2.2 ආවේදන ක්ෂේත්‍රයේ අරමුණු

2.2.3 මනෝචාලක ක්ෂේත්‍රයේ අරමුණු

**2.3 සංගීත අධ්‍යාපන සංකල්ප**

2.3.1 කොඩලි මතය

2.3.2 සුසුකි මතය

**2.4 සංගීත විෂය ඉගැන්වීමේ ස්වභාවය**

2.4.1 ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය

2.4.2 ඉගැනුම් න්‍යාය

2.4.3 විෂය මාලාව

2.4.4 ඇගයීම් ක්‍රමය

**3 පරිච්ඡේදය**

**ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන විකාශය**

**3.1 ඓතිහාසික පසුබිම**

3.1.1 පුරාතන යුගය

3.1.2 මධ්‍යයතන යුගය

**3.2 පෘතුගීසී අධ්‍යාපන ක්‍රමය තුළ සංගීත අධ්‍යාපනය**

**3.3 ලන්දේසී අධ්‍යාපන ක්‍රමය තුළ සංගීත අධ්‍යාපනය**

**3.4 බ්‍රිතාන්‍ය යුගයේ සංගීත අධ්‍යාපනය**

**3.5 නිදහසින් පසු ලංකාවේ සංගීත අධ්‍යාපනය**

3.5.1 පාසල් රජයට පවරාගැනීම දක්වා යුගය

3.5.2 ශ්‍රී ලංකාවේ ජනරජයක් වීම දක්වා යුගය

3.5.3 පළාත් සභා බිහිවීම දක්වා යුගය

**4 පරිච්ඡේදය**

**ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපනයේ ස්වභාවය හා ප්‍රවණතා පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය, දත්ත විශ්ලේෂණය හා පර්යේෂණ වාර්තාව**

**4.1 ක්‍රමවේදය හා පර්යේෂණ උපකරණ**

4.1.1. පළමුවැනි අරමුණ

4.1.1.1. පර්යේෂණ ක්‍රමය

4.1.1.2 නියැදිය තෝරාගැනීම

4.1.1.3 දත්ත රැස්කරන උපකරණ

4.1.2 දෙවැනි අරමුණ

4.1.2.1. පර්යේෂණ ක්‍රමය

4.1.2.2 නියැදිය තෝරාගැනීම

4.1.2.3 දත්ත රැස්කරන උපකරණ

4.1.3 තෙවැනි අරමුණ

4.1.3.1. පර්යේෂණ ක්‍රමය

4.1.3.2 නියැදිය තෝරාගැනීම

4.1.3.3 දත්ත රැස්කරන උපකරණ

**4.2 දත්ත ඉදිරිපත් කිරීම හා දත්ත විශ්ලේෂණය**

4.2.1 සංගීත අධ්‍යාපනයේ නූතන ප්‍රවණතා

4.2.2 සංගීත අධ්‍යාපනයේ ගැටලු

**5 පරිච්ඡේදය**

**සමාලෝචනය**

**5.1 නිගමන**

**5.2 යෝජනා**

- **මූලාශ්‍රය හා ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය**
- **උපග්‍රන්ථය 1**
- **උපග්‍රන්ථය 2**